# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඉහත සඳහන් කොමිෂන් සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී /අභිචෝදක තනතුර**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

01. සමාජයීය විද්‍යාව, ජනමාධ්‍ය හෝ නිතීය පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණයන්ට අදාල වූ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

02. සමාජයීය විද්‍යාව, ජනමාධ්‍ය හෝ නිතීය පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් (PhD)

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2 හෝ 3) (දැනට මෙම කොමිෂන් සභාවේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා පමණි)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නිතීය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා කේෂ්ත්‍රය පිළිබඳ විශේෂවේදී / සාමාන්‍ය උපාධියක්

සමඟ

නිතීය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා කේෂ්ත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

"අධ්‍යයන/පර්යේෂණ" සේවා ගණයෙහි (AR 1) තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

03. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නිතීය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා කේෂ්ත්‍රය පිළිබඳ විශේෂවේදී / සාමාන්‍ය උපාධියක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයකින් නිතීය, ජනමාධ්‍ය හෝ සමාජයීය විද්‍යා කේෂ්ත්‍රය ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම

සහ

“අධ්‍යයන/පර්යේෂණ” සේවා (AR 1) ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස : අවුරුදු30 නො අඩු හා 55 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු නැත.

**✡ නඩු ගොණුකිරීම,පැමිණිලි මෙහෙයවීම ඇතුලු අධිකරණ කටයුතු පිළිබඳ පලපුරුද්ද හා නෛතික ප්‍රතිපත්ති සම්පාදනය හා පර්යේෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ඇත.**

වැටුප ක්‍රමය: AR 2 - රු. (76,200 - 10 x 2,000 - 96,200)

**බඳවා ගැනිමේ ක්‍රමවේදය**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

| | | |
|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම් වලට අතිරේකව) | ලකුණු 30 |
| 02. | පර්යේෂණ පළපුරුද්ද | ලකුණු 10 |
| 03. | ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර සහ ප්‍රදානයන් | ලකුණු 20 |
| 04. | විෂය බාහිර ක්‍රියාකාරකම් | ලකුණු 10 |
| 05. | පෞරුෂය | ලකුණු 15 |
| 06. | අදාල ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුම | ලකුණු 15 |
| | මුළු ලකුණු | 100 |

**02. නීති සහකාර තනතුරු**

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබිම

**වයස :** අවුරුදු22 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු නැත.

✡ ස්වාධීන කොමිෂන් සභාවක රාජකාරි පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**වැටුප් ක්‍රමය** - MA 3: **රු:** 32,200 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,960

**බඳවා ගැනිමේ ක්‍රමවේදය :**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අමතර අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

## 03. සංවර්ධන නිලධාරී තනතුරු

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම

**වයස :** අවුරුදු22 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු නැත.

✡ **ස්වාධීන කොමිෂන් සභාවක රාජකාරි පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.**

**වැටුප් ක්‍රමය -** MA 3: **රු:** 32,200 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,960

**බඳවා ගැනීමේ ක්‍රමවේදය:**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 20 |
| 02. | අදාළ අමතර අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

## 04. භාෂා පරිවර්තක (දෙමළ) තනතුර

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව හෝ විෂයක් ලෙස සමක්ව ලබා ගත් උපාධියක් තිබීම

සහ

උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ.පො.ද.(සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී දෙමළ භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිම.

**වයස :** අවුරුදු22 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු නැත.

**වැටුප් ක්‍රමය - MA 3: රු:** 32,200 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,960

**බඳවා ගැනීමේ ක්‍රමවේදය:**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01. | අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අමතර අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

## 05. කළමනාකරණ සහකාර තනතුරු

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
   - **i.** සිංහල / දෙමළ
   - **ii.** ගණිතය
   - **iii.** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර **(04)** කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය **(06)** කින් සමත්ව තිබීම.

02. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

03. තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්:- පරිගණක හැකියාව පිළිබඳ මාස 06 කට නොඅඩු පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද සහතිකය

✡ **ස්වාධීන කොමිෂන් සභාවක රාජකාරි පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.**

**අභ්‍යන්තර අයදුම්කරුවන්:- (දැනට මෙම කොමිෂන් සභාවේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා පමණි)**

01. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කල හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
   - **i.** සිංහල / දෙමළ
   - **ii.** ගණිතය
   - **iii.** ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර **(04)** කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය **(06)** කින් සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු **05** ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස :** අවුරුදු 18 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු නැත.

**වැටුප් ක්‍රමය -** MA 1-2 **රු. (**27,910 - 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710 - 49,080)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 30 |
| 03. | අනෙකුත් කුසලතා/කාර්ය සාධනය | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

**පොදු කොන්දේසි**

1. රාජ්‍ය හෝ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.
2. තෝරාගනු ලබන අය 1956 අංක 22 රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීති රීති වලට යටත් වේ.
3. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට කොමිෂන් සභාව මගින් 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා 3% දායක මුදලක් ගෙවනු ලැබේ.
4. පත්වීම්ලාභීන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණ ආවරණය ලැබේ.
5. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් සහතික වල ඡායා පිටපත් සමඟ මෙහි පලකර ඇති ආකෘතියට අනුව තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2024.02.09 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව**
**කාමර අංක 203-204**
**ගොඩනැගිලි අංක 02**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව**
**කොළඹ 07.**